රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 233

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1983 සැප්තැම්බර් මස 28 දින.

සියළු ම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත ය.

අමතර කටයුතුවල වැඩ බැලීමට පත්කරන රජයේ
නිලධාරීන් ගේ සහ නැවත සේවයේ යොදවන
විශ්‍රාමිකයන් ගේ වැටුප් සහ පාරිශ්‍රමිකයන්

කරුණාකර පහත සඳහන් කරුණු සටහන් කර ගන්න.

I. රජයේ සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් රජයේ සේවයේ කටයුතු නැවත සේවයේ යෙදවීමට හෝ රාජ්‍ය සංස්ථා සේවයේ යෙදවීමට හෝ අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු ය.

II. වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට පෙර රජයේ සේවයෙන් විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් රජයේ සේවයේ කටයුතු නැවත සේවයේ යෙදවීමට හෝ රාජ්‍ය සංස්ථාවක සේවයේ යෙදවීමට හෝ යම් විශේෂ හේතු ඇති බවට අමාත්‍ය මණ්ඩලය සෑහීමට පත් වුවහොත් මිස ඔවුන් නැවත සේවයේ යොදනු නොලැබේ.

III. නීතිමය විධිවිධානයන් යටතේ රජයේ නිලධාරියෙකුට අමතර කටයුතු පූර්ණ රාජකාරි ලෙස පැවරීමට සිදුවන අවස්ථාවක හැර, රජයේ සේවයේ හෝ රජයේ සේවයේ සහ රාජ්‍ය සංස්ථාවක හෝ එක් තනතුරකට වැඩි තනතුරු ගණනක සේවය කළ යුතු නම් සියලු ම රාජකාරි කිරීම සඳහා වන්නේ නම් අමාත්‍ය - මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු ය.

IV. සෑම විට නිලධාරියා අමාත්‍ය මණ්ඩලය වන අවස්ථාවන්හි දී හැර, තනතුරක් නිත්‍ය වශයෙන් දරණ තනතුරට අමතර හෝ තාවකාලික පුරප්පාඩුවක් පිරවීමට හෝ සිය රාජකාරිවලට අමතරව කටයුතු වැඩ බැලීමට රජයේ නිලධාරියෙකු පත්කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම අවශ්‍ය නොවේ. එවැනි අවස්ථාවන්හි දී පාරිශ්‍රමිකයන් සඳහා රීති ආයතන සංග්‍රහයේ සලසා ඇත.

V. වයස අවුරුදු 60 සම්පූර්ණ වීමෙන් පසුව රජයේ සේවයෙන් විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් රජයේ සේවයේ කටයුතු නැවත සේවයේ යෙදවුවහොත් හෝ රාජ්‍ය සංස්ථාවක සේවයේ යෙදවුවහොත් හෝ, ඔහුට එයින්, ඔහුගේ විශ්‍රාම වැටුපත් (දීමනා රහිතව) සමග ඔහු නැවත සේවයේ යොදා ගනී/සේවයේ යොදා ඇති, තනතුරේ දීමනා සහිතව වැටුප හෝ අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇති ගිවිසුම් වැටුප සහ ඊට දීමනා වියදම් දීමනාව හෝ ගෙවිය යුතු ය. නැවත සේවයේ යොදවන්නන් ඔහු විශ්‍රාම ගන්නාවිට දැරූ තනතුරෙහි ම නම් විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී ලබමින් තිබූ වැටුප ඔහුට ගෙවිය යුතු ය.

/...2

VI. වයස අවුරුදු 60 සම්පූර්ණ කිරීමට පෙර විශ්‍රාම ගෙන ඇති පුද්ගලයෙකු
නැවත සේවයේ යෙදවීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇති අවස්ථාවක දී
ඔහුට ඉහත (V) දක්වා ඇති ආකාරයට ගෙවිය යුතු ය.

VII. තම නිත්‍ය තනතුරේ පූර්ණ රාජකාරියට අමතරව, නීතිමය විධිවිධානයන් යටතේ
අමතර තනතුරක පූර්ණ රාජකාරි ඉටුකරන රජයේ නිලධරයෙකුට ද, ඉහත
(III) යටතේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති නිලධරයෙකුට ද,
තම නිත්‍ය තනතුරේ දීමනා සහිත වැටුප ද, තම නිත්‍ය තනතුරේ රාජකාරි
වලට අමතරව පූර්ණ රාජකාරි ඉටුකරන තනතුරේ දීමනා රහිත වැටුප ද
ගෙවිය යුතු ය. එසේ වුවද, අමතර තනතුරේ පූර්ණ රාජකාරි ඉටුකිරීම
සඳහා කෙරෙන ගෙවීම, එම අතිරේක තනතුරේ ආරම්භක වැටුපෙන් 1/4
කට සීමාවිය යුතු ය. වැටුපක් නියම කර නැති තනතුරක් සම්බන්ධයෙන් නම්,
1/4 ගණන් බැලිය යුත්තේ, භාණ්ඩාගාරයේ ලේකම් ගේ උපදෙස් ද ඇතිව
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්, ඉල්ලීමක් කළවිට, තීරණය කරන
කල්පිත වැටුපෙන් ය.

02. 1982.05.31 දින හා අං.ක. 197 (VII) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන්
සංශෝධනය කර ඇති ආයතන සංග්‍රහයේ VII වෙනි පරිච්ඡේදයේ 12:6 වගන්තියේ දැක්වෙන
වැඩබැලීමේ වැටුප් පිළිබඳ සීමා ක්‍රියාත්මක නොවේ.

03. මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලින් උද්ගත වන පාරිශ්‍රමික වෙනස්වීම් ක්‍රියාත්මක වන්නේ
1984 ජනවාරි 1 වැනි දින සිට පමණි.

Siriwardhana

ලේකම්,

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

ආනා/23.